14

# ගුරුළුවතෙහි සංකේතාශ්‍රිත යථාර්ථ නිරූපණය පිළිබඳ අධ්‍යයනයක්

*සේනානායක, සසී ලවන්දි.* [1]

ගුණදාස අමරසේකරයන්ගේ කාව්‍ය නිර්මාණ අතර ගුරුළුවත කාව්‍ය සංග්‍රහය (1962) විශේෂ තැනක් ගන්නා කාව්‍ය සංග්‍රහයකි. එම කාව්‍ය සංග්‍රහය ඔස්සේ අමරසේකරයන් විෂය ලෝකයෙන් ඈත් ව මනඃකල්පිත ලෝකයක ජීවත් වන්නකුට උද්ගත විය හැකි අර්බුද නිරූපණය කර තිබෙන්නේ සාම්ප්‍රදායික ජන රීතියත්, සංකේත භාවිතයත් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමිනි. එහි දී භාවිත කළ සංකේත අතුරින් ගුරුළා කලාකරුවකුගේ සංකේතයක් වශයෙන් ද, බොල් පොළොව යථාර්ථ ලෝකයෙහි සංකේතයක් වශයෙන් ද, රනඹර කලාකරුවා විසින් ගොඩනගා ගන්නා ලද කාල්පනික ලෝකයෙහි සංකේතයක් වශයෙන් ද, ස්ත්‍රිය යථාර්ථ ලෝකයේ ජීවත්වන පුද්ගලයකුගේ සංකේතයක් වශයෙන් ද, නාගයා හා ගින්න ලිංගික ශක්තියේ සංකේත වශයෙන් ද, රස ලෝකය කායික ස්පර්ශ ලෝකයේ සංකේතයක් වශයෙන් ද ප්‍රධාන ව හඳුනා ගැනීමට හැකි වේ. මෙම සංකේත භාවිත කිරීමේ දී ගුණදාස අමරසේකර සාර්ථක වූ බව මෙන් ම ඇතැම් අවස්ථාවන්හි දී අසාර්ථක වූ බව ද ගුරුළුවත කාව්‍යය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. නිදර්ශනයක් ලෙස ස්ත්‍රිය යන සංකේතය ගොඩ නැඟීමේ දී ඔහුගේ දුර්වල ලක්ෂණ දැක ගත හැකි ය. මෙම පර්යේෂණයේ දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ගුරුළුවත කාව්‍යයත් ද්විතීයික මූලාශ්‍රය වශයෙන් විවිධ විචාර විමර්ශන අන්තර්ගත කෘති, සඟරා ලිපි හා අන්තර්ජාලය ඔස්සේ තොරතුරු ගවේෂණය කිරීමත් සිදු විය. මේ සියලු මූලාශ්‍රය ඔස්සේ සිදු කරන ලද විමර්ශනයන් අනුව ගුරුළුවත කාව්‍ය සංග්‍රහයෙහි සංකේත භාවිතයෙන් භෞතික ලෝකය අබිබවා මනෝ ලෝකයක අතරමං වූවකුගේ ජීවන යථාර්ථය නිරූපණය කිරීමේ දී ගුණදාස අමරසේකර සම්පූර්ණයෙන් ම සාර්ථක නොවූ බැව් නිගමනය කළ හැකි වේ.

ප්‍රමුඛ පදඃ ගුරුළුවත, සංකේත, යථාර්ථ නිරූපණය, රනඹර, බොල් පොළොව

1 *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර. සිංහල අධ්‍යයනාංශය.* Sasisenanayakeuok@gmail.com